172409
16/03/2004
රු. 3000/-

# ක්‍රි. ව. 1750 සිට1865 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ බුද්ධශාසන ඉතිහාසය

(ගණින්නාන්සේලාගේ කාර්යභාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා
අධ්‍යයන අංශයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය.

2003

ලේඛනාරූඪ අංකය : GS / SS /693 / 98.

නම : ජේ. කේ. ජී. කාන්ති.

විභාග අංකය : MA / SS / 0129

ඉතිහාස අධ්‍යයන අංශය,
රුහුණ විශ්වවිද්‍යාලය,
වැල්ලමඩම,
මාතර.

172409

## ප්‍රකාශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය මාලනි ඇඳගම මහත්මියගේ උපදේශකත්වය යටතේ සම්පාදිත මෙම ශාස්ත්‍රපති නිබන්ධය හෝ ඉන් කොටසක් හෝ කිසියම් විශ්වවිද්‍යාලයක උපාධියක් හෝ පාඨමාලවක් හෝ ඩිප්ලෝමාවක් හෝ සඳහා මීට ප්‍රථම ඉදිරිපත් කර නොමැති බවත්, උපුටාගත් ස්ථානය තිසි පරිදි සඳහන් නොකර අන් තැනැත්තෙකු විසින් කලින් පළ කරන ලද හෝ ලියන ලද කිසිවක් මාගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට මෙම නිබන්ධනයට ඇතුළත් නොවන බවත් මම ප්‍රකාශ කරමි.

දිනය: 02/04/2003

ජේ.කේ.ඒ කාන්ති

සහතික කරමි

දිනය: 02/04/2003

මහාචාර්ය මාලනි ඇඳගම

වාචික පරීක්ෂණයෙන් පසු නිර්දේශිත සංශෝධනයන් සිදුකොට ඇති බව සහතික කරමි.

දිනය: 6/1/2004

මහාචාර්ය එස්. බී. හෙට්ටිආරච්චි
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

දිනය: 6/1/2004

මහාචාර්ය වී. ජී. කුලතුංග
අංශ ප්‍රධාන
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ඉතිහාස හා පුරා විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
06 JAN 2004
ගංගොඩවිල - නුගේගොඩ

# හැඳින්වීම

ක්‍රි.පූ. 3වන සියවසේ ලංකාවට බුද්ධාගම හඳුන්වා දුන් අවස්ථාවේ සිට 16වන සියවස මුල් භාගය දක්වා එය රාජ්‍ය අනුග්‍රහය ලබමින් වර්ධනය වූ අතර ලාංකීය සමාජයේ කුදු මහත් කටයුතු කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් බවට ද පත් විය. එහෙත් 16වන සියවසේ පෘතුගීසීන්ගේ ආගමනයත් සමග මුහුදුබඩ ප්‍රදේශවල බුද්ධාගමට හිමි ව තිබූ ප්‍රමුඛත්වය නැති කිරීමට ඔවුහු කටයුතු කළහ. ඉන්පසු එම ප්‍රදේශවල බලයට පත් වූ ලන්දේසි සහ ඉංග්‍රීසි ජාතිකයන්ගේ පාලන කාලවල දී ද බුද්ධාගමේ ශීඝ්‍ර පරිහානියක් දක්නට ලැබිණි. එකී කාලසීමාව තුළ දී භික්ෂූන් වහන්සේලාට නොයෙකුත් දුක් පීඩාවන්ට මුහුණ දීමට සිදු විය.

බෞද්ධ පොත්පත් සහ පූජා භාණ්ඩ රැක ගැනීමේ පරම අභිලාෂයෙන් ක්‍රියා කළ භික්ෂූන් වහන්සේලා අප්‍රකට වේශයෙන් නොයෙක් තැන්වල සැඟවී සිටිමින් ආගමික සේවාවන් ඉටු කළහ. එම පිරිස ගණින්නාන්සේලා ලෙස හැඳින්වූහ. ක්‍රි.ව.1750 පමණ වන විට ආගමික සංවිධානයක් වශයෙන් බොහෝ දුරට සංවිධානය වී සිටි ගණින්නාන්සේලාට උඩරට රජුගේ සහයෝගය ද ලැබිණි. රජුගේ ඉල්ලීම මත ලන්දේසි අනුග්‍රහය ද ලැබුණ බැවින් ඔවුන්ට මුහුදුබඩ ප්‍රදේශවල නිදහසේ සිය ආගමික කටයුතු පවත්වාගෙන යාමට හැකි විය. මේ අයුරින් බුදු සසුන නගා සිටුවීමේ නව බලවේගයක් ආරම්භ වී තිබූ අතර එවකට බිඳවැටී තිබූ උපසම්පද විනය කර්මය නැවත පිහිටුවීම සඳහා එමගින් පියවර ගැනිණ.

18වන සියවසේ මැද භාගයේ සිට 19 සියවසේ අග භාගය දක්වා ලාංකීය භික්ෂු ශාසනයේ සිදු වූ මෙම සමස්ථ ක්‍රියාවලිය පිළිබඳ පුළුල් පර්යේෂණයක් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

ක්‍රි.ව. 1750 - 1865 දක්වා ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනයේ ඉතිහාසය සහ මාතෘකාව යටතේ ගණින්නාන්සේලාගේ කාර්ය භාරය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් කෙරුණු මෙම අධ්‍යයනය පරිච්ඡේද 5කින් සමන්විතය. ශ්‍රී ලංකාව යුරෝපා ජාතීන්ගේ පාලනයට නතුවීමට පෙර ලාංකීය බුදු සසුනට හිමිව තිබූ තත්වය මෙන්ම ඒ කාලය තුළ රාජ්‍ය අනුග්‍රහය ලබමින් භික්ෂූන් වහන්සේලා බුදු සසුනේ වර්ධනයට කටයුතු කළ අන්දමත් පෘතුගීසි හා ලන්දේසි පාලනය යටතේ මුහුදුබඩ ප්‍රදේශවල භික්ෂු ශාසනය පරිහානියට පත්ව තිබූ ආකාරයත් සාකච්ඡා කෙරෙන පළමු

පරිච්ඡේදයේ මෙම අධ්‍යයනයට උපයෝගී කොටගත් මූලාශ්‍ර පිළිබඳව විග්‍රහයක් ද ඇතුළත් වේ.

දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලාංකීය භික්ෂූන් වහන්සේලාට අහිමිව තිබූ උපසම්පදාව නැවත ලබා ගැනීමට හැකි වූ ක්‍රි.ව.1753 වර්ෂය ශ්‍රී ලාංකීය බුද්ධ ශාසන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් වශයෙන් හඳුන්වා දිය හැකි ය. එම අවස්ථාව උදා කර ගැනීමට හැකි වූයේ බුදු සසුන පරිහානියට පත්ව තිබූ වකවානුවේ ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ ගණින්නාන්සේලාගේ ක්‍රියා මාර්ග නිසාවෙනි. මෙරට බුදු සසුනේ වර්ධනයට එබඳු දායකත්වයක් සැපයූ ගණින්නාන්සේලාගේ සේවය අමතක කොට ලංකාවේ බෞද්ධ පුනරුද ව්‍යාපාරය පිළිබඳව කතා කළ නොහැකි ය. මෙහි දෙවන පරිච්ඡේදයේදී එකී ගණින්නාන්සේලා පිළිබඳව පුළුල් අධ්‍යයනයක් සිදු කෙරේ.

19වන සියවස මුල් භාගයේ සිට සමස්ත දිවයින පුරාම ඉංග්‍රීසි ආධිපත්‍යය පුළුල් පදනමක් මත ව්‍යාප්ත විය. එමෙන්ම බුද්ධාගමේ ප්‍රමුඛත්වය එතෙක් ආරක්ෂා වී තිබූ උඩරට රාජ්‍ය තුළ පවා එම තත්වය අහිමි වී රට පුරා මිෂනාරි ව්‍යාපාරයේ ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබිණි. මෙරට බුද්ධ ශාසනයේ ඉතිහාසයට බලපෑම් එල්ල කළ ඉංග්‍රීසින්ගේ ක්‍රියා මාර්ග සහ මිෂනාරි ව්‍යාපාරය පිළිබඳවත් එමගින් පීඩාවට පත්වූ බෞද්ධයන් 19වන සියවසේ අග භාගය වන විට නැගී සිටීම නිසා ඇති වූ බෞද්ධ ප්‍රබෝධයට පසුබිම සකස් වූ ආකාරය පිළිබඳවත් තුන්වන පරිච්ඡේදයේදී සාකච්ඡා කෙරේ.

19 වන සියවස ආරම්භයේ සිට ශ්‍රී ලංකාවේ භික්ෂු ශාසනයේ විවිධ වෙනස් වීම් සිදුවීම දැකිය හැකි ය. විශේෂයෙන් භික්ෂු ශාසනයේ විවිධ නිකායන් බිහි වූයේ මේ අවධියේ දී ය. මෙහි හතරවන පරිච්ඡේදයේදී අමරපුර හා රාමඤ්ඤ නිකාය බිහි වීම පිළිබඳවත් ඒවායේ ක්‍රියා මාර්ග පිළිබඳවත් අවධානය යොමු කෙරේ.

මෙම නිබන්ධනයේ පස්වන පරිච්ඡේදය අධ්‍යයනයේ සමාලෝචනය සඳහාත් අධ්‍යයන කාලය තුළ ලැබූ අත්දැකීම් ඇසුරින් ඉදිරිපත් කෙරෙන නිගමන සඳහාත් වෙන් කොට ඇත.

බොහෝ දුරට ලිඛිත මූලාශ්‍ර උපයෝගී කර ගනිමින් මෙම අධ්‍යයනය කිරීමට සිදුවිය. ඊට අමතරව අන්තර්ජාලය තුළින් ලබා ගත් තොරතුරු ද මීට ඇතුළත් කරගත හැකි විය. මූලාශ්‍රය පරිශීලනයේදී ගැටලු කිහිපයකට මුහුණ දීමට ද සිදු විය.

මෙම කාලපරිච්ඡේදය පිළිබඳව, විශේෂයෙන් ගණින්නාන්සේලා පිළිබඳව තොරතුරු ගවේෂණය කිරීමේදී ප්‍රාථමික මූලාශ්‍රයවල දක්නට ලැබූ හිඟය බොහෝ සෙයින් බලපෑවේ ය. නමුදු මූලාශ්‍රය අතලොස්ස පවා පක්ෂපාතී තොරතුරු අන්තර්ගත වන බැවින් සත්‍ය තොරතුරු තෝරා ගැනීමේදී මහත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු විය. එමෙන් රාජ්‍ය ලේඛනාගාරයේ ඇති අත්ලිපි, සන්නස්, තල්පත් වැනි ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය කිරීමෙන් එම අඩුපාඩුව බොහෝ දුරට මගහරවා ගත හැකි විය. විහාරස්ථානවලින් වුවද ප්‍රමාණවත් මූලාශ්‍රය ලබා ගැනීමට නොහැකි වීම මෙම අධ්‍යයනයේදී මුහුණ දුන් ගැටලුවක් විය. එමෙන් උගත් වැඩි හිටි භික්ෂූන් වහන්සේලා සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡා මගින් වැදගත් තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකි වීම ධනාත්මක ලක්ෂණයක් ලෙස දැක්විය යුතුව ඇත.

# උපකාරානුස්මෘති

මෙම අධ්‍යයන කටයුතුවල නිරතවන කාල සීමාව තුළ මා හට විඳීමට සිදුවූ සියලු දුෂ්කරතාවන්ට සාර්ථකව මුහුණදීමට මා දිරිමත් කරමින් පර්යේෂණ කටයුතුවල ආරම්භයේ සිට අවසානය දක්වා අවශ්‍ය උපදෙස් සැපයීමෙන් හා මග පෙන්වීමෙන් වරෙක ගුරුතුමියක ලෙසත් වරෙක මවක ලෙසත් කටයුතු කළ දයාබර ගුරු මෑණියන්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය මාලනී ඇඳගම මහත්මියට,

වාචික පරීක්ෂණයෙන් පසු අවශ්‍ය සංශෝධන කිරීමට මට සහයෝගය දැක්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය එස්.බී. හෙට්ටිආරච්චි මහතාට සහ අධ්‍යයන අංශ ප්‍රධාන මහාචාර්ය ටී.ජී. කුලතුංග මහතාට,

අසනීප තත්වයේ පසුවෙමින් වුවද මා හට අවශ්‍ය තොරතුරු ලබා දීමට කාරුණික වූ අපවත් වී වදාළ මහාචාර්ය කඹුරුපිටියේ වනරතන ස්වාමීන් වහන්සේට සහ ගණින්නාන්සේලා පිළිබඳව තොරතුරු ලබාදීමට දයකවූ විහාරාධිපති ස්වාමීන් වහන්සේලා ඇතුළු භික්ෂූන් වහන්සේලාට,

පොත් පත් සපයා දීමෙන් සහයෝගය දැක්වූ ගොම්බද්දල සුමංගල, ගල්කන්දේ ධම්මානන්ද යන ස්වාමීන් වහන්සේලාට,

සෝදුපත් බැලීමෙන් සහයෝගය දැක්වූ රුහුණ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී.ඩී. සුගතපාල මහතාට, කථිකාචාරිණී සුනන්දා පේමසිරි මෙනවියට, අකුරැස්ස අධ්‍යාපන කලාපයේ ජ්‍යෙෂ්ඨ ගුරු උපදේශක එස්.එච්.වසන්ත ගුණසේන මහතාට

අධ්‍යයන කටයුතුවල ආරම්භයේ සිට අවසානය දක්වා සියලුම කටයුතු සඳහා නොමඳ සහයෝගයක් දක්වමින් මා දිරිමත් කළ දයාබර ජනනීට,

මා පර්යේෂණ කටයුතුවල නිරතවන කාලයේ මදකට හෝ අහිමි වූ මව් සෙනෙහස වෙනුවෙන් කඳුළක් නොසලා උපේක්ෂාවෙන් බලා සිටි දුව ගිත්මිට සහ පුත රිසිතට,

නන් අයුරින් සහයෝගය දැක්වූ ප්‍රදීපා ජීවනී මෙනවියට, විමලා. පී. ලියනගේ මෙනවියට, ගයාන් ලසන්ත මහතාට සහ කලහෙවත්ත මහතාට,

නම් වශයෙන් සඳහන් නොකළ ද මෙම පර්යේෂණ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සවියක් දිරියක් වූ සැමට

කෘතඥතා පූර්වක ස්තූතිය මෙයින් පිරිනමමි.

# කෙටි යෙදුම්

| | |
|---|---|
| රාජා | රාජාවලිය |
| මපු | මන්දාරම්පුර පුවත |
| සසාව | ස සරාජ් සාධු චරියාව |
| ශ්‍යාමෝ | ශ්‍යාමෝපසම්පදාවත |
| සිංසාව | සිංහල සාහිත්‍ය වංශය |
| ලංලබ | ලංකාවේ ලංදේසි බලය |
| බෞඅස | බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය |
| මාසාසානි | මාතර සාහිත්‍යධරයන් හා සාහිත්‍ය නිබන්ධන |
| සාසව | සාසනාවතීර්ණ වර්ණනාව |
| ශ්‍රීඅඉ | ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය |
| ශ්‍රීපුසඉ | ශ්‍රී ලංකාවේ පුවත්පත් සඟරා ඉතිහාසය |
| සාවදී | සාසනවංසදීපය |
| සසස | සරණංකර සංඝරාජසමය |
| ඩොදි | ඩොයිලිගේ දිනපොත |

පටුන


පිටුව

හැඳින්වීම i - iii

කෙටියෙදුම් iv

උපකාරානුස්මෘති v - vi

1. පළමුවන පරිච්ඡේදය. 1 - 66

මූලාශ්‍රය අධ්‍යයනය සහ පෘතුගීසින් හා
ලන්දේසීන් යටතේ බුදු සසුන.

1.1 දේශීය මූලාශ්‍රය.

1.1.1 සාහිත්‍යමය මූලාශ්‍රය.

1.1.2 ශිල ලිපි ලේඛන.

1.2 විදේශීය මූලාශ්‍රය

1.3. පැරණි ලංකාවේ බුදු සසුන රාජ්‍යය සහ සමාජය.

1.3.1 පෘතුගීසින් යටතේ මුහුදුබඩ ප්‍රදේශවල බුදු සසුන.

1.3.2 ලන්දේසීන් යටතේ මුහුදුබඩ ප්‍රදේශවල බුදු සසුන.

2. දෙවන පරිච්ඡේදය. 67 - 131

බුදු සසුන නගාසිටුවීම සඳහා ගණින්නාන්සේලා
ගෙන් ඉටුවූ කාර්යභාරය.

2.1 පෙරණි සසුන.

2.2 ගණින්නාන්සේලාගෙන් ඉටුවූ ශාසනික සේවය.

2.2.1 උපසම්පදව පිහිටුවීම.

2.3 සංඝරාජ හිමි සහ උඩරට ශාසනික දියුණුව.

2.4 මුහුදුබඩ ප්‍රදේශයන්හි ශාසනික දියුණුව.

2.4.1 වෙහැල්ලේ පරම්පරාව.

2.4.2 මුල්හිරිගල පරම්පරාව.

3. තුන්වන පරිච්ඡේදය. 132 -166

ඉංග්‍රීසින් යටතේ බුදු සසුන.

3.1 ඉංග්‍රීසින් බුදු සසුන නො සලකා හැරීම.

3.2 ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාරයේ වර්ධනය.

3.3 බෞද්ධ පුනරුද ව්‍යාපාරයට පසුබිම සකස්වීම.

4. හතරවන පරිච්ඡේදය. 167 -216

19වන සියවසේ නව නිකාය බිහිවීම.

4.1 අමරපුර නිකාය ආරම්භවීම.

4.2 අමරපුර නිකාය කොටස්වීම.

4.2.1 අමරපුර මහා නිකාය.

4.2.2 අමරපුර සද්ධම්ම වංශික නිකාය.

4.2.3 අමරපුර කල්‍යාණී වංශික නිකාය.

4.2.4 ශ්‍රී ධර්ම රක්ෂිතවංශ නිකාය.

4.2.5 උඩරට අමරපුර නිකාය.

4.2.5.1 සබරගමු ශ්‍රීපුර නිකාය.

4.3 අමරපුර නිකායෙන් ඇතිවූ භේදය.

4.4 ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකාය.

5. පස්වන පරිච්ඡේදය.

සමාලෝචනය හා නිගමන. 217 -228

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය. 229 -244

# පළමුවැනි පරිච්ඡේදය

## මූලාශ්‍රය අධ්‍යයනය සහ පෘතුගීසීන් හා ලන්දේසීන් යටතේ බුදු සසුන.

### 1. මූලාශ්‍රය අධ්‍යයනය.

ක්‍රි.ව.1750-1865 දක්වා ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනයේ ඉතිහාසය සහ මැලයන් ගණින්නාන්සේලාගේ කාර්ය භාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කෙරෙන මෙම අධ්‍යයනයේ දී උපයෝගී කොට ගත හැකි ප්‍රධාන මූලාශ්‍ර කිහිපයක් ඇත. ඒවා දේශීය මූලාශ්‍ර හා විදේශීය මූලාශ්‍ර වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකි ය. අනතුරුව දේශීය මූලාශ්‍ර නිල ලිපි ලේඛන හා සාහිත්‍යමය මූලාශ්‍ර වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් යටතට ගොනු කළ හැකි ය. විදේශීය මූලාශ්‍ර වශයෙන් වර්ග කරනු ලැබුවේ විදේශීය පාලකයින් සිය පාලන කාලය තුළ හුවමාරු කළ ලිපි ලේඛන සහ විදේශිකයන් ලංකාව සම්බන්ධයෙන් රචනා කළ සාහිත්‍ය කෘති වේ.

#### 1.1 දේශීය මූලාශ්‍ර

#### 1.1.1 සාහිත්‍යමය මූලාශ්‍ර

මහාවංසය

මහාවිහාරය කේන්ද්‍රකොටගෙන දිවයිනේ සහ ශාසනයේ ඉතිහාසය ඉදිරිපත් කෙරෙන වාර්තාව මහාවංසය නම් වේ. මහාවංසයෙහි දෙවැනි කොටස මෙම අධ්‍යයනය සඳහා උපයෝගී කොට ගැනිණි. මහාවංසය ලිවීම ආරම්භ කළේ ක්‍රි.ව. 5වන සියවසට අයත් මහාවිහාරවාසී දීඝසන්ද පිරිවෙනේ විසූ මහානාම තෙරුන් විසිනි. පසු වර්තමානය දක්වා විවිධ කතුවරුන් විසින් ලියමින් සිංහලේ අඛණ්ඩ ඉතිහාස කතාව අප අතට පත් කොට ඇත. මහානාම හිමි විසින් පාලි භාෂාවෙන් රචිත මහාවංසයේ පළමු කොටසට තථාගතාභිගමනයේ (බුදුන් වහන්සේගේ ලංකාගමනය) සිට මහසෙන් රාජ්‍ය සමය දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඇතුළත් වේ. මහාවංසය ඉංග්‍රීසියට පරිවර්තනය කළ ගයිගර්

ගෙනා මහාවංස ලෙස හඳුන්වා ඇත්තේ පරිච්ඡේද 1 සිට 37 දක්වා කොටස පමණි. එතැන් සිට ලියා ඇති සෙසු කොටස් ඇතැම් අය විසින් චූලවංස ලෙස හැඳින්වීමට පුරුදුව සිටින නමුත් 38වෙනි පරිච්ඡේදයේ සිට ඇති එම කොටස මහාවංසයේ දෙවැනි කොටස ලෙස හැඳින්වීම නිවැරදි බව ඉතිහාසඥයින්ගේ පිළිගැනීම වේ. මහාවංසයේ දෙවෙනි තෙවෙනි කොටස් සම්පාදනය කල අය එම කෘති තුල එක් එක් පරිච්ඡේදය අවසානයේ මහාවංසයේ පළමු අදියර මෙයින් නිමියේ ය, දෙවැනි අදියර මෙයින් නිමියේ ය ආදි වශයෙන් දිගින් දිගට ම මහාවංස යන්න භාවිත කර තිබීමෙන් ඒ බව සනාථ වේ. ඔවුන් කිසිදු තැනක චූලවංස යන්න භාවිත කොට නොමැත. මහාවංසයේ දෙවැනි භාගය කොටස් තුනකින් සමන්විත ය. එහි මුල් කොටසින් පළමුවන පරාක්‍රමබාහු රාජ්‍ය කාලය (ක්‍රි.ව.1153-1186) දක්වා අවධිය විස්තර කරන අතර 37වන පරිච්ඡේදයේ සිට 79 දක්වා වූ එම කොටස රචනා කරන ලද්දේ ක්‍රි.ව. දහතුන් වන සියවසේ මුල් භාගයේ දී ධර්මකීර්ති නම් ස්වාමින් වහන්සේ නමක් විසිනි. හතරවන පරාක්‍රමබාහු(1302-1326) රජුගේ කාලය දක්වා විස්තර වන 79වන පරිච්ඡේදයේ සිට 90 පරිච්ඡේදය දක්වා වූ දෙවන කොටසෙහි කතෘ අඥාත ය. කීර්ති ශ්‍රී රාජසිංහ(1747-1782) රජතුමාගේ කාලය තෙක් 90 පරිච්ඡේදයේ සිට 100 පරිච්ඡේදය දක්වා වූ තුන්වන කොටස ලියන ලද්දේ තිබ්බොටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත හිමියන් විසිනි.

> මහාවංසයෙහි අගට කුරුණෑගල් නුවර පණ්ඩිත පරාක්‍රම
> මහ රජ්ජුරුවන් පටන් අපමහා රාජෝත්තමයන් දක්වා
> අභිනව ගාථා අටසියයක් ලියා එකතු කරමින්

යනුවෙන් බුද්ධරක්ඛිත හිමියන් පිළිබඳව සංඝරාජ සාධු චරියාවේ සඳහන් වේ.[1]

පාලියෙන් රචිත මහාවංසය මුල්වරට සිංහලට පරිවර්තනය කරන ලද්දේ ශ්‍රී සුමංගලාභිධාන හික්කඩුවේ නායක ස්ථවිරපාදයන් වහන්සේ හා දොන් ඇන්ඩ්‍රිස් සිල්වා බටුවන්තුඩාවේ යන ප්‍රවීන පඬිවරුන් දෙදෙනා විසිනි. එම පරිවර්තනයේ දී පරිච්ඡේද 100 දක්වා වූ මහාවංසයට 101වන පරිච්ඡේදයක් ද එකතු කොට ලංකාවේ අවසාන දේශීය රාජ්‍යානිය දක්වා ඉතිහාසය සඳහන් කර ඇත. ඉහත පඬිවරුන් දෙදෙනා විසින් පරිවර්තනය කරන ලද මහාවංස පිටපත මෙම අධ්‍යයනයේ දී මූලාශ්‍රය කර ගැනිණ.

[1] විමලානන්ද තෙන්නකෝන් (සංස්) සංඝරාජ සාධු චරියාව - රත්න පොත් ප්‍රකාශකයෝ - කොළඹ - 1969 - 22 පිටුව.

ක්‍රි.ව. 18වන සියවසේ අවසාන භාගයේ සිට 19වන සියවස අවසාන භාගය දක්වා කාලසීමාව තුළ ලංකාවේ බෞද්ධ ආගමික ඉතිහාසය හැදෑරීමේ දී මහාවංශයෙන් ලැබෙනුයේ මහඟු පිටිවහලකි. විශේෂයෙන් ලංකාවේ බුද්ධාගම පිරිහීම, බුද්ධාගම නගා සිටුවීම සඳහා ඒ ඒ පාලකයන්ගෙන් ඉටුවූ සේවාව ආදිය පිළිබඳව දීර්ඝ විස්තරයක් මහාවංශයේ ප්‍රථම භාගයේ ඇතුළත් ය. 1753 ලංකාවේ සියම් උපසම්පදාව පිහිටුවීමට අනුග්‍රහය දැක්වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජු පිළිබඳව වර්ණනාත්මක විස්තරයක් මෙහි ඇතුළත් ය.

මහාවංශයේ සෑම පරිච්ඡේදයක ම අවසානයේ "සුදු ජනයාගේ පහන් සංවේගය සඳහා කළ" යන පාඨය සඳහන් වීමෙන් පැහැදිලි වන්නේ මෙය ආගමික කරුණු ඉදිරිපත් කිරීම තුළින් පාඨකයාගේ මනස ලෞකික කරුණු වෙතින් ආධ්‍යාත්මික කරුණු වෙතට යොමු කිරීමට උත්සාහ දරා ඇති බවයි. බුද්ධාගමට අනුග්‍රහය දැක්වූ රජවරුන්ගේ ශ්‍රී විභූතිය වර්ණනා කිරීමට මහාවංශ කතුවරුන් උත්සාහ දරා ඇති බව පැහැදිලි ය. මෙම උත්සාහය නිසා ම බුද්ධාගමට බලපෑ අහිතකර තත්වයන් පිළිබඳ කරුණු මහාවංශය අමතක කොට දමා ඇති අයුරු දැකිය හැකිය. විශේෂයෙන් 18, 19 සියවස්වල එක් අතකින් උඩරට රාජ්‍යයේ හින්දු ආගම වර්ධනය වීම නිසා බුදු සමයේ ව්‍යාප්තියට පහර වැදුණි. අනෙක් අතින් මීට වඩා අනතුරුදායක වූයේ යුරෝපා ජාතීන් විසින් පහත රට ප්‍රදේශවල ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීම හේතුවෙන් බුදු සසුනේ පැවැත්මට එල්ල වූ තර්ජනයයි. එහෙත් මෙම කරුණු කිසිවක් ඉස්මතු කර දැක්වීමට මහාවංශ කතුවරුන් උත්සාහ දරා නොමැත. මෙම කරුණු ද එළිදරව් කරමින් ශ්‍රී ලංකාවේ බුදු සසුනේ ඉතිහාසය ලියා තැබුවේ නම් මහාවංශය මීට වඩා සාර්ථක මූලාශ්‍ය කෘතියක් වනු ඇත.

රාජාවලිය

රාජාවලිය වනාහි දඹදෙණි යුගයේ පටන් සම්පාදිත වූ කඩඉම්, විත්ති විස්තර ආදී ලේඛන සමූහය පසුබිම් කරගෙන එම ග්‍රන්ථ සමූහයෙන් ආධාරය ලබමින් සම්පාදිත ඉතිහාස වාර්තාවකි. රාජාවලිය කර්තෘ පිළිබඳව මත කිපයක් ඉදිරිපත් වී ඇත. උප්හැම් සඳහන් කර ඇත්තේ කතුවරුන් 4දෙනෙක විසින් අවස්ථා හතරක දී රාජාවලිය සම්පාදනය කළ බව ය. කර්තෘන් කිහිප දෙනෙක විසින් වරින් වර සම්පාදනය කළ බව ටර්නර් පවසා ඇත. රාජාවලියේ කතුවරුන් දෙදෙනෙකුට වඩා සිටිය නොහැකි බව

වික්‍රමසිංහ ගණිතාචාර්ය මහතාගේ අදහසයි. ගෛගර්ගේ මතය වන්නේ රාජාවලිය එක කතුවරයකුගේ රචනයක් බව ය. රාජාවලිය නම් යෙදුණු පොත් කිහිපයක් ඇත්තේ ය.[1] වන්නි රාජාවලිය, රාජාවල්ලිය, විජය රාජාවලිය, මල්ල රාජාවලිය, බුද්ධ රාජාවලිය, මීපිතැල්ලේ රාජාවලිය, රාවණ රාජාවලිය ආදි වශයෙන් ඓතිහාසික පුවත් පාදක කොට සම්පාදනය වූ රාජාවලි පිටපත් කිහිපයකි. ලක්දිව පිළිබඳ අඛණ්ඩ ඓතිහාසික වාර්තාවක් සැපයීම රාජාවලි කතුවරුන් ගේ අරමුණ වූ බව පැහැදිලි ය.[2] මෙම රාජාවලි කෘතීන් අතරින් රටේ ප්‍රධාන රාජ්‍ය සම්බන්ධයෙන් සංග්‍රහ කළ තොරතුරු ඇතුළත් ඉතිහාසය දක්වෙන්නේ රාජාවලිය නමින් හැඳින්වෙන කෘතියේ ය.[3]

පූජාවලිය, අලකේශ්වර යුද්ධය වැනි සිංහල භාෂාමය වාර්තා ප්‍රයෝජනයට ගනිමින් රාජාවලිය සම්පාදනය කොට ඇත.[4] ග්‍රන්ථය රචනාවී ඇති ශෛලිය අනුව එය කොටස් දෙකකට වෙන් කළ හැකි ය. මින් පළමු කොටසට කෝට්ටේ රාජ්‍ය කාලය තෙක් ඉතිහාසය ඇතුළත් ය. රාජාවලියේ වඩාත් වැදගත් කොටස ලෙස සැලකිය හැක්කේ කෝට්ටේ යුගයෙන් පසුව රචනා වූවා සේ සැලකෙන දෙවන කොටස ය. ගම්පොළ රජ පෙළපතේ ivවන භුවනෙකබාහු(1341-1351) රජුගේ පටන් ගම්පොළ රාජධානියේ පාලකයන් පිළිබඳව ද උඩරට රාජධානියේ 2වන විමලධර්මසූරිය (1687-1707) රජුගේ කාලය දක්වා ද සියවස් තුනක පමණ කාලසීමාවක් දෙවන කොටසේ විස්තර කොට ඇත. මෙම කොටස එක කතුවරයකු විසින් රචනා කර ඇති බව එහි රචනා ශෛලියෙන් තහවුරු වේ. දෙවන රාජසිංහ රජුගෙන් පසු සවිස්තර තොරතුරු නො දක්වෙන බැවින් දෙවන රාජසිංහ රාජ්‍ය කාලය ඉකුත් වී ටික කලකින් කෘතිය රචනා කිරීම අවසන් කර ඇති බව සිතිය හැකි ය.

මෙම අධ්‍යයන කාලය සඳහා වඩාත් වැදගත් වනුයේ පසළොස්වන සියවසේ සිට ඉදිරි කාලය සම්බන්ධයෙන් රාජාවලිය ලබා දෙන තොරතුරු ය. මෙම කාල සීමාවේ දී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි බලය ව්‍යාප්ත වූ ආකාරයත් ඔවුන්ගෙන් බුද්ධාගමට එල්ල වූ පීඩාවනුත් පිළිබඳ වටිනා තොරතුරු රාශියක් මෙම කොටසට

---

[1] සුරවීර, ඒ. වී. (සංස්) රාජාවලිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - 1997 - 31 -35 පිටු
[2] එම
[3] එම
[4] එම 30 පිටුව